**හැටන් - නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

---------------------------------------------------------------------

හැටන් නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල අතර 2010 නොවැම්බර් 02 දින එළඹි අංක එස්ආර්අයි-20 දරන ණය ගිවිසුම හා 2015 ජුනි 22 දින එළඹි එස්ආර්අයි-26 දරන අතිරේක ණය ගිවිසුම සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. හැටන් සිට නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙළඳ පොළවලට ප්‍රවේශය සඳහා රැකියා අවස්ථා සහ සමාජ සේවා සැපයීම වැඩිදියුණු කිරීම මගින් සමාජ ආර්ථික වර්ධනය ප්‍රබෝධමත් කරලීම හා දකුණු පළාතේ සංවර්ධන සමානතාව ව්‍යාපෘතියේ අරමුණුවේ. එබැවින් හැටන්- සිට නුවරඑළිය මාර්ගයේ කිලෝමීටර් 35.6ක් වැඩිදියුණු කිරීම,කොටගල උමං මාර්ගය හා නානුඔය යටින් දිවෙන දුම්රිය මාර්ග පාලම ඉදිකිරීම යෝජනා කර තිබුණි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,618කට සමාන එජාඩො මිලියන 49.92ක් වූ අතර, ඉන් රු.මිලියන 4,501.2 කට සමාන එජඩො මිලියන 40ක් සැපයීමට ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල එකඟ වී තිබුණි. ඊට අමතරව රු. මිලියන 2,010.23 කට සමාන එ.ජ.ඩො. මිලියන 17 ක අතිරේක ණය මුදලක් මිල විචලනයන්, අතිරේක වැඩ පිරිවැය හා කොටගල උමං මාර්ගය හා නානුඔය හුගත පාලම ඉදිකිරීම් වැඩ සඳහා ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල, ප්‍රදානයකර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිතය.ව්‍යාපෘති කාලය 2016 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක

සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමණය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහි ලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව වූයේද යන බව

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම්

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට හා මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වනුයේ

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කිරීමේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නොසැසඳු - ශේෂයන්**

මූල්‍ය ප්‍රකාශනවලට අනුව ව්‍යාපෘතිය රු. මිලියන 28.68 ක් වර්ෂය තුළ වැය කර තිබුණි. කෙසේ වෙතත්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශ විසර්ජන ගිණුමට අනුව ඊට අදාල අනුරූපි අගය රු. මිලියන 29.70ක් ලෙස පෙන්නුම් කෙරිණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය,සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කීපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම** | **උපයෝජනය කළ අරමුදල්** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | **සමාලෝචිත වර්ෂය තුළ** | | **2015 දෙසැම්බර් 31 දිනට** | |
| | **එ.ජ.ඩො මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **එ .ජ.ඩො මිලියන** | **රු.මිලියන** | **එ .ජ.ඩො මිලියන** | **රු.මිලියන** |
| **ආ.ස.ස.අ** | | | | | | | |
| (i) ආරම්භක | 40.00 | 4,501.20 | 2,600 | 4.49 | 571.88 | 37.84 | 5,020.86 |
| (ii) අතිරේක | 17.14 | 2,010.23 | - | 14.08 | 1,863.93 | 14.08 | 1863.93 |
| **ශ්‍රී.ල.ර.මූ.** | | | | | | | |
| (i) ආරම්භක | 9.92 | 1,116.86 | 240 | - | 28.68 | - | 186.83 |
| (ii) අතිරේක | 3.34 | 1,055.52 | - | - | - | - | - |
| | **70.40** | **8,683.81** | **2,840** | **18.57** | **2,464.49** | **51.92** | **7,071.62** |

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හැටන් නුවරඑළිය මාර්ගයේ කි.මී. 72+000 සිට කි.මී. 115+430 දක්වා කී.මී 35.6 ක් පුනරුත්ථාපන වැඩ 2011 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර මාස 9 ක ප්‍රමාදයක් සහිතව වැඩ නිමකොට 2015 මාර්තු 02 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරිය අවිස්සාවේල්ල හැටන් මාර්ගයේ කි.මී. 68+500 සිට කි.මී. 72+000 දක්වා කී.මී. 3.5 ක් අතිරේක ණය මුදලේ ඉතිරි වූ රු. මිලියන 650 ක මුදල උපයෝගී කරගෙන පුනරුත්ථාපනය කිරීමට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හැටන් නුවරඑළිය මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා සකස්කළ මුල් පිරිවැය ඇස්තමේන්තුව වූ රු. මිලියන 3,767.70 පසුව අතිරේක වැඩ හා අසාර්ථක නිර්මාණ සැලසුම් නිසා රු. මිලියන 6,747.17 වශයෙන් ප්‍රතිශෝධනය කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය හා උපදේශකවරුන් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පෙර නිර්මාණ සැලසුම් හා ප්‍රමාණපත් පිළියෙල කිරීමේදී නිසි අවධානය යොමු කරන ලද්දේ නම්, එම අතිරේක පිරිවැය වලක්වා ගැනීමට තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(1) 2005 වර්ෂයේ පිළියෙල කරන ලද ප්‍රමාණපත් පදනම් කරගෙන 2011 වර්ෂයේදී මාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම නිසා කොටගල උමං මාර්ගය හා නානුඔය භූගත මාර්ගය මාර්ග කොන්ත්‍රාත්තුවේ මුල් ඇස්තමේන්තුවට අතිරේක වැඩ ලෙස සලකා තිබුණි.

(11) ඉහළ කොත්මලේ ජල විදුලිබල මධ්‍යස්ථානය ඉදිකිරීම් වැඩ සඳහා බරවාහන ගමනාගමනය හේතුවෙන් මාර්ග තත්ත්වය දුර්වල වී තිබුණු අතර එම තත්ත්වය කොන්ත්‍රාත්තු පිරිනැමීම් කාලයේදී සලකා නොතිබීම නිරීක්ෂණය විය.

(111) අතිරේක ණය ලබාගැනීම් ක්‍රියා පිළිවෙත මාස 17ක ප්‍රමාදයක් සහිතව සම්පූර්ණ කර තිබුණු අතර ඒ හේතුවෙන් මාර්ග පුනරුත්ථාපන වැඩ ප්‍රමාද වූ අතර කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද බිල්පත් නිරවුල් කිරීමද ප්‍රමාදව සිදුකර තිබුණි.

(ආ) පුනරුත්ථාපනය කරන ලද මාර්ග කොටසේ කී.මී 85+530 මාර්ග උරහිස් පටුවීම අසම්පූර්ණ සම්පින්ඩනයන්, කී.මී 84+358හි අවිධිමත් විදුලි සංදේශ රැහැන් මාර්ග මාරුකිරීම, කී.මී. 114+110 සිට අවිධිමත් ආරක්ෂිත කනු සවිකිරීම් හේතුවෙන් පුනරුත්ථාපන මාර්ග කොටසේ තත්ත්වය පිළිගතහැකි ප්‍රමිත මට්ටමකට ළඟා වී නොමැතිව 2016 ජනවාරි මස සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී නිර්ක්ෂණය විය

(ඇ) අවිස්සාවේල්ල හැටන් මාර්ගයේ කී.මී. 68+500 සිට කී.මී 72+000 මාර්ග කොටසේ පුනරුත්ථාපන වැඩ සඳහා එම කොන්ත්‍රාත්කරුට විචලනයක් වශයෙන් හැටන් නුවරඑළිය මාර්ග කොටසේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ප්‍රධාන කොන්ත්‍රාත්තුවෙන් බලාපොරොත්තුව රු.

මිලියන 598.94ක් ඉතිරිය අවිස්සාවේල්ල හැටන් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා වෙන්කර ඇතත් විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලය ලෙස නිමකිරීමට බලාපොරොත්තු වූ සමහර වැඩ සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

## 3.4 ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු පිළිබඳ කරුණු

-----------------------------------------------------

නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් සපයන ලද තොරතුරු අනුව ඉඩම් කැබලි 494 ක් අත්පත් කර ගෙන තිබූ අතර ප්‍රමාද වී තක්සේරු වාර්තා එවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට කැබලි 78 කට පමණක් වන්දි ගෙවා තිබුණි. එම නිසා තක්සේරු වාර්තා ලැබීම ප්‍රමාද වී තිබූ අතර වන්දි ගෙවීම සඳහා අතිරේක පිරිවැය දැරීමේ අවධානම විගණනයේදි බැහැරකළ නොහැක.

## 3.5 පාරිසරික ආරක්ෂණ පිළිබඳ කරුණු

------------------------------------------

කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද පාරිසරික කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාරිසරික ආරක්ෂණ වැඩ සඳහා දක්වා ඇති ක්‍රියාපිළිවෙත් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු කාලය පුරාම ක්‍රියාත්මක කිරීම අවශ්‍යය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු සේවයේ යෙදවූ පාරිසරික ආරක්ෂණ නිලධාරියා විසින් යෙදවූ පාරිසරික ආරක්ෂණ ක්‍රියාපිළිවෙත් දැන ගැනීමට මාසික පාරිසරික වාර්තාවන් හා පාරිසරික පරීක්ෂණ ලැයිස්තු ආදිය ඉදිරිපත්කර නොතිබුණි.